වෙළුම 11 | කාණ්ඩය 02 | අගෝස්තු 2022

# පුවත් හසුන

## උක් පර්යේෂණ ආයතනය

# පර්යේෂණ සහ සංවර්ධන නව උපායමාර්ගික සැලැස්මක් සම්පාදනය කිරීම ඇරඹේ



2023 -2025 කාලය සඳහා උපායමාර්ගික සැලසුමක් සම්පාදනය කිරීම ආයතනයේ පාලක මණ්ඩලයේ උපදෙස් අනුව මේ වන විට සිදු කරමින් පවතී.

මහාචාර්ය එම්. තිලකසිරි විසින් වැඩමුළුව මෙහෙයවීම

උපායමාර්ගික සැලසුම පිළියෙල කිරීමේ මූලික අදියර යටතේ පළමු දැනුවත් කිරීමේ වැඩසටහන උක් පර්යේෂණ ආයතනයේ සභාපති, අධ්‍යක්ෂ/ප්‍ර.වි.නි. හා සියලු අංශ ප්‍රධානීන් සමග සූම් තාක්ෂණය ඔස්සේ පවත්වන ලදී. මෙම සැලසුම සකස් කිරීම සම්බන්ධයෙන් උපදෙස් ලබා දීම හා මෙහෙයවීම සිදු කරනු ලබන්නේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ උපදේශක, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ හිටපු අධ්‍යක්ෂ ජනරාල් මහාචාර්ය එම්. තිලකසිරි විසිනි.

මෙහි ප්‍රථම වැඩමුළුව, පර්යේෂණ කාර්ය මණ්ඩලය, පාලන හා ගිණුම් අංශවල කර්ය මණ්ඩලය හා තාක්ෂණ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් 2022 අගෝස්තු 17 දින උක් පර්යේෂණ අයතනයේ දී පවත්වන ලදී. මේ සඳහා පාලක මණ්ඩල සාමාජික ආචාර්ය ඩබ්ලිව්. පී. සෝමරත්න ද සහභාගී විය.



# 2022 ප්‍රථම භාගයේ සීනි කර්මාන්තයේ කාර්යසාධනය

දිනේෂ් කොඩිතුවක්කු - ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී

2022 වර්ෂයේ ප්‍රථම භාගය අවසන් වන විට උක් මෙට්‍රික් ටොන් 613,434ක් ඇඹරීමටත්, සීනි මෙට්‍රික් ටොන් 39,683ක් නිපදවීමටත් සෙවනගල, පැල්වත්ත, ඇතිමලේ හා ගල්ඔය යන සීනි කර්මාන්තශාලා සමත්ව ඇත.

03 පිටුවට...

## ඇතුළු පිටු


| | |
|---|---|
| උක් කර්මාන්තය පිළිබඳ විස්තර ලබා ගැනීමට නව තොරතුරු හා ප්‍රවර්ධන මධ්‍යස්ථානයක් | 02 |
| බෝග හා සම්පත් කළමනාකරණ අංශයට ආචාර්ය උපාධියක් | 02 |
| ක්ෂේත්‍ර අත්හදාබැලීම් සඳහා ගොවිපළ උපකරණ රැසක් ගල්ඔය උක් වගාවට | 02 |
| 2022 ප්‍රථම භාගයේ සීනි කර්මාන්තයේ කාර්යසාධනය | 03 |
| පර්යේෂණ සඳහා ඩිපිටල් තාක්ෂණය භාවිතය පිළිබඳ වැඩමුළුවක් | 03 |
| පසේ සරුසාර බව වැඩිකරන සන්හෙම්ප් වගාව ප්‍රචලිත කිරීමට පියවර ගැනේ | 03 |
| රසායනික පොහොර සමග කාබනික පොහොර යෙදූ ක්ෂේත්‍රයෙන් ඉහළ උක් අස්වැන්නක් | 04-05 |
| SL 2000 කාණ්ඩයේ 00 95 සීනි නිෂ්පාදන විභවය වැඩිම ප්‍රභේදය ලෙස නැවත තහවුරු වේ | 04-05 |
| උක් වගාව හා සම්බන්ධ ව්‍යාප්ති හා පුහුණු වැඩසටහන් | 06-07 |
| උක් වගාවේ නිෂ්පාදන පිරිවැය 2022 | 08 |

# උක් කර්මාන්තය පිළිබඳ විස්තර ලබා ගැනීමට නව තොරතුරු හා ප්‍රවර්ධන මධ්‍යස්ථානයක්

උක් කර්මාන්තය සහ එහි ආයෝජන අවස්ථාවන් සඳහා උනන්දුව දක්වන ව්‍යවසායකයින් හට මෙන්ම විශ්වවිද්‍යාල සිසුන් හා පොදු ජනතාවට අවශ්‍යය තොරතුරු හා තාක්ෂණික දැනුම ලබා ගැනීම සඳහා ස්ථාපිත තොරතුරු හා ප්‍රවර්ධන මධ්‍යස්ථානය අංක 743/25, 04 වන පටුමග, මුවන්හෙල වත්ත, තලංගම උතුර, මාළඹේ පිහිටි උක් පර්යේෂණායතන කාර්යාලයේ සතියේ දිනවල විවෘතව ඇති අතර, එමගින් පහත සඳහන් තොරතුරු, සේවාවන් හා තාක්ෂණික උපදෙස් ලබා ගැනීමට අවස්ථාව සලසා ඇත.




**තොරතුරු**

- උක් කර්මාන්තය ආශ්‍රිත තොරතුරු
- උක් වගාවට සුදුසු ඉඩම් හා අනෙකුත් සම්පත් පිළිබඳ තොරතුරු
- උක් වගාවේ ශෂ්‍ය විද්‍යාත්මක තොරතුරු
- සීනි නිෂ්පාදනය, නිෂ්පාදන පිරිවැය හා පරිභෝජනය පිළිබඳ තොරතුරු
- උක් කර්මාන්තයේ අතුරු නිෂ්පාදනයන් පිළිබඳ තොරතුරු
- අනාගත සීනි වෙළඳපොළ පිළිබඳ තොරතුරු
- පර්යේෂණ හා සංවර්ධන තොරතුරු
- කාලගුණික දත්ත

**තාක්ෂණික උපදේශන**

- උක් වගාව හා නඩත්තුව
- උක් හකුරු, උක් පැණි හා නැවුම් උක් යුෂ නිෂ්පාදනය

**සේවාවන්**

- සීනි, පාංශු, පොහොර, ජලය හා පත්‍ර තත්ව විශ්ලේෂණ සේවා
- උක් වගාව ආශ්‍රිත පුහුණු වැඩසටහන් පැවැත්වීම

මීට අමතරව උක් හකුරු හා උක් පැණි වැනි උක් කර්මාන්තයේ නිෂ්පාදනයන් මහජනතාව අතර ප්‍රචලිත කිරීම මෙම මධ්‍යස්ථානය ස්ථාපිත කිරීමේ තවත් අපේක්ෂාවකි.

# බෝග හා සම්පත් කළමනාකරණ අංශයට ආචාර්ය උපාධියක්

බෝග හා සම්පත් කළමනාකරණ අංශයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරීවරයෙක් ලෙස සේවය කරන ඒ. එල්. චන්ද්‍රපිත් ද සිල්වා මහතා 2022 වර්ෂයේ මාර්තු මාසයේ දී සිය ආචාර්ය උපාධිය ලබා ගන්නා ලදී. චන්ද්‍රපිත් ද සිල්වා මහතා සිය මූලික උපාධිය රුහුණු විශ්වවිද්‍යාලයෙන්ද, දර්ශනපති උපාධිය පේරාදෙණිය කෘෂිකර්ම පශ්චාත් උපාධි අධ්‍යයන ආයතයෙන් ද හිමිකරගෙන ඇත.

චන්ද්‍රපිත් ද සිල්වා මහතා උක් පර්යේෂණ ආයතනයේ සේවයට එක් වන්නේ 1997 වර්ෂයේ පර්යේෂණ නිලධාරීවරයෙක් ලෙස වන අතර, 2020 ඔක්තෝබර් මාසයේ සිට ආයතනයේ වැඩබලන නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ, තාක්ෂණ හුවමාරු හා සංවර්ධන) ලෙස ද කටයුතු කරනු ලැබේ.

ආචාර්ය චන්ද්‍රපිත් ද සිල්වා, උක් වගාවේ බෝග හා සම්පත් කළමනාකරණය සම්බන්ධයෙන් පර්යේෂණ ගණනාවක් සිදු කර ඇති අතර, එම අංශයේ විවිධ පර්යේෂණ සඳහා ද සිය දායකත්වය ලබා දෙනු ලබන අතරම, මේ වන විට පර්යේෂණ පත්‍රිකා රැසකටද හිමිකම් කියනු ලැබේ.

2019 වර්ෂයේ ඉංදියාවේ උත්තර ප්‍රදේශයේ ඉංදියානු උක් පර්යේෂණ ආයතනයේ පැවති 'සුගර්කොන්' ජාත්‍යන්තර සමුළුවේ දී උක් කර්මාන්තයට සිදු කළ දායකත්වය වෙනුවෙන් විශිෂ්ඨතා සම්මානය හිමිකර ගත් අතර, එම සමුළුවේ දී ඉදිරිපත් කළ එක් පර්යේෂණ පත්‍රිකාවක් වෙනුවෙන් කීර්තිමක් කථිකයාට හිමි සම්මානයත් දිනා ගැනීමට ද සමත් වී ඇත.



ආචාර්ය ඒ එල් සී ද සිල්වා

# ක්ෂේත්‍ර අත්හදාබැලීම් සඳහා ගොවිපළ උපකරණ රැසක් ගල්ඔය උක් වගාවට



හිඟුරාන උක් සංවර්ධන නිලධාරී කාර්යාලයට ගොවිපොළ උපකරණ බාර දීම

ගල්ඔය වැවිලි (පුද්.) සමාගමේ ඉල්ලීමකට අනුව උක් පර්යේෂණ ආයතනයේ යාන්ත්‍රීකරණ තාක්ෂණ අංශය සතු ගොවිපළ යන්ත්‍රෝපකරණ රැසක් ක්ෂේත්‍ර අත්හදා බැලීම් සඳහා ආයතනයේ හිඟුරාන උක් වගා සංවර්ධන නිලධාරී කාර්යාලය වෙත ලබාදීම පසුගියදා සිදු කෙරිණි. එම ගොවිපොළ උපකරණවල යෝග්‍යතාව පරීක්ෂා කිරීම, හිඟුරාන උක් වගා සංවර්ධන නිලධාරී ඩබ්ලිව් පී එම් එස් වේරගොඩ මහතාගේ අධීක්ෂණය යටතේ ක්ෂේත්‍ර අත්හදා බැලීම් සිදු කිරීමට නියමිතය. මෙම ඡායාරූපයෙන් දැක්වෙන්නේ එම ගොවිපළ උපකරණ හිඟුරාන උක් වගා සංවර්ධන නිලධාරී කාර්යාලය වෙත බාරදුන් අවස්ථාව වන අතර, මේ සඳහා ගල්ඔය වැවිලි සමාගම නියෝජනය කරමින් ඉඩම් සංවර්ධන අංශයේ අංශ ප්‍රධානී හා විධායක-ශෂ්‍ය විද්‍යා නිලධාරී ද සහභාගී විය.

01 පිටුවෙන්...

## 2022 ප්‍රථම භාගයේ සීනි කර්මාන්තයේ කාර්යසාධනය

වගුව ෑ- 2021 හා 2022 වර්ෂවල පළමු අර්ධයේ සීනි හා එතනෝල් නිෂ්පාදනය

| කර්මාන්තශාලාව | අඹරන ලද උක් දඬු ප්‍රමාණය (මෙට්‍රික් ටොන්) | | නිපදවන ලද සීනි ප්‍රමාණය (මෙට්‍රික් ටොන්) | | නිපදවන ලද එතනෝල් ප්‍රමාණය (ලීටර් මිලියන) | |
|---|---|---|---|---|---|---|
| | 2021 | 2022 | 2021 | 2022 | 2021 | 2022 |
| පැල්වත්ත | 156,250 | 247,342 | 7,358 | 15,829 | 3.23 | 3.47 |
| ගල්ඔය | 200,292 | 205,343 | 9,745 | 14,490 | 3.22 | 3.35 |
| සෙවනගල | 140,000 | 104,520 | 7,186 | 5,114 | 2.22 | 1.30 |
| ඇතිමලේ | 60,000 | 56,229 | 3,219 | 4,250 | - | 0.83 |
| **එකතුව** | **556,542** | **613,434** | **27,508** | **39,683** | **8.67** | **8.94** |

පැල්වත්ත, ගල්ඔය හා ඇතිමලේ යන කර්මාන්තශාලාවල සීනි උකහාගැනීමේ ප්‍රතිශතය හා සීනි නිෂ්පාදනය 2022 වර්ෂයේ ප්‍රථම භාගයේ දී පෙර වසරට වඩා කැපී පෙනෙන ලෙස වැඩි වී ඇත.

එය 2021 වර්ෂයේ පළමු අර්ධයේ අඹරන ලද උක් දඬු ප්‍රමාණය වූ මෙට්‍රික් ටොන් 556,542 හා නිෂ්පාදනය කළ සීනි ප්‍රමාණය වූ මෙට්‍රික් ටොන් 27,508 හා සසඳන කළ පිළිවෙළින් 10.2% හා 44%ක පමණ වැඩිවීමකි.

මෙම තත්වය රසායනික පොහොර හා වල්නාශක හිඟය මෙන්ම ඉන්ධන අර්බුදය හමුවේ වුවද දේශීය සීනි කර්මාන්තය ලැබූ ජයග්‍රහණයකි. නිෂ්පාදනය වැඩිවීම කෙරෙහි උක් මිලෙහි වැඩිවීම මෙන්ම සීනි හා එතනෝල්වල මිලෙහි සැලකිය යුතු වැඩිවීම ද බලපාන්නට ඇති බව අනුමාන කළ හැකිය. එසේම සීනි කර්මාන්තශාලා මගින් උක් වගාව සඳහා අවශ්‍ය යෙදවුම් හිඟයකින් තොරව සාධාරණ මිලකට උක් ගොවීන්ට ලබා දීමත්, මේ සඳහා පිටිවහලක් වී ඇති බව පෙනේ.

එතනෝල් නිෂ්පාදනයෙහි ද පෙර වසරට සාපේක්ෂව සුළු වැඩිවීමක් දක්නට ලැබෙන අතර, ඒ සඳහා එතනෝල් නිෂ්පාදනයට අලුතින් එක්වූ ඇතිමලේ ස්කාගාරයේ නිෂ්පාදනය මෙන්ම පැල්වත්ත හා ගල්ඔය ස්කාගාරවල නිෂ්පාදන වැඩිවීමද හේතුවී ඇත.

මෙම තත්වයන් යටතේ 2022 වසරේ දී ද වාර්තාගත සීනි හා එතනෝල් නිෂ්පාදනයක් පිළිබඳව බලාපොරොත්තු තබා ගත හැකිය. එහෙත් පවතින ඉන්ධන අර්බුදය උක් දඬු කරමාන්තශාලා වෙත ප්‍රවාහනයට මෙන්ම ඇතැම් කර්මාන්තශාලාවල ක්‍රියාකාරීත්වයට ද බලපෑම් එල්ල කොට ඇති නිසා එම තත්වයන්ගේ සමනය වීමද අත්‍යාවශ්‍ය වේ.

## පර්යේෂණ සඳහා ඩිජිටල් තාක්ෂණය භාවිතය පිළිබඳ වැඩමුළුවක්

පර්යේෂණ දත්ත කාර්යක්ෂමව හැසිරවීම සඳහා වළාකුළු පරිගණක තාක්ෂණය (Cloud Technology) භාවිතය පිළිබඳව වැඩමුළුවක් 2022 අගෝස්තු 18 දින උක් පර්යේෂණ ආයතනයේ, පර්යේෂණ, තාක්ෂණ හුවමාරු හා සංවර්ධන, පාලන හා ගිණුම් අංශවල නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් පැවැත්විණි. පර්යේෂණ හා අනෙක් කාර්යන් වෙනුවෙන් වඩාත් නිවැරදි ලෙස ඩිජිටල් තාක්ෂණයන් භාවිතා කරන ආකාරය පිළිබඳ වැඩි දුරටත් දැනුම ලබා දීම මෙහිදී සිදු කරන ලද අතර, යාන්ත්‍රීකරණ තාක්ෂණ අංශයේ ආචාර්ය තිලංක ආරියවංශ හා බෝග පෝෂණ අංශයේ ලහිරු මධුශංක යන පර්යේෂණ නිලධාරීන් විසින් මෙම වැඩමුළුව මෙහෙයවන ලදී.


නිලධාරීන් වැඩමුළුවට ක්‍රියාකාරීව සම්බන්ධ වෙමින්

## පසේ සරුසාර බව වැඩිකරන සන්හෙම්ප් වගාව ප්‍රචලිත කිරීමට පියවර ගැනේ


ගල්ඔය වැවිලි සමාගමේ විධායක-ශෂ්‍ය විද්‍යා වෙත සන්හෙම්ප් බීජ ලබා දීම

පසේ පෝෂණය ඉහළ නැංවීම සඳහා යොදා ගත හැකි බෝගයක් ලෙස සන්හෙම්ප් හැඳින්විය හැකිය. මෙමගින් පසේ නයිට්‍රජන් ප්‍රතිශතය සැලකිය යුතු මට්ටමකින් ඉහළ නැංවීමට හැකියාවක් ඇතිබව ලෝකයේ සිදු කරන ලද විවිධ පර්යේෂණ මගින් තහවුරු කර ඇත.

එබැවින් මෙම සන්හෙම්ප් බෝගය යොදාගනිමින් පුරන් වීමට අත්හැර දමන ලද උක් වගා ඉඩම්වල පස පුනරුත්ථාපනය කිරීම සඳහා උක් පර්යේෂණ ආයතනයේ තාක්ෂණ හුවමාරු හා සංවර්ධන අංශය මගින් වැඩසටහනක් දියත් කර තිබේ.

ඒ අනුව සන්හෙම්ප් වගාව සීනි කර්මාන්තායතයන වෙත හඳුන්වා දීමට උක් පර්යේෂණ ආයතනය පියවර ගනිමින් ඇත. මේ යටතේ ලංකා සීනි සමාගමේ සෙවනගල ඒකකයටත්, ඇතිමලේ හා ගල්ඔය වැවිලි සමාගම් වෙතත් සන්හෙම්ප් බීජ බෙදා දීම සිදු කරන ලද අතර, ඉදිරියේදී උක් වගාකරන ගොවීන් වෙතද බීජ ලබා දීමට සැලසුම්කොට ඇත.

## උක් ප්‍රභේදවල මේරීමේ රටාවන් පිළිබඳ දැනුවත් කිරීම



නිලධාරීන් දැනුවත් කිරීම

උක් ප්‍රභේදවල මේරීමේ රටාවන් සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහනක් ගල්ඔය වැවිලි සමාගමේ දී පසුගියදා පැවැත්විණි. මෙහිදී දැනට වාණිජ වගාව සඳහා හඳුන්වා දෙන ලද උක් ප්‍රභේදවල මේරීමේ රටාවන් පිළිබඳව මෙන්ම එම රටාවන් අනුව උක් වගා කිරීමට සැලසුම් කිරීමේ වැදගත්කම පිළිබඳවත් දැනුවත් කරන ලදී. මෙම වැඩසටහන හිඟුරාන උක් වගා සංවර්ධන නිලධාරී කාර්යාලය මගින් සංවිධානය කළ අතර, ගල්ඔය සමාගමේ පිටස්තර ගොවි අංශයේ හා ශෂ්‍ය විද්‍යා අංශයේ කළමනාකරුවන්/විධායක නිලධාරීන් සහභාගී විය. උක් පර්යේෂණ ආයතනයේ බෝග හා සම්පත් කළමනාකරණ අංශයේ පර්යේෂණ නිලධාරී අමිල චතුරංග මහතා විසින් වැඩසටහන මෙහෙයවන ලදී.

## මොණරාගල කාර්මික විද්‍යාලයේ ක්ෂේත්‍ර සහයක පාඨමාලාව හදාරන සිසුන්ට උක් වගාව පිළිබඳ දැනුම ලබාදීම



සිසුන්ට උක් වගාව පිළිබඳ දේශන පැවැත්වීම

NVQ 4 මට්ටමේ ක්ෂේත්‍ර සහායක - කෘෂිකර්ම පාඨමාලාව හදාරන සිසුන් වෙනුවෙන් උක් වගාව සම්බන්ධ ඒක්දින පුහුණුවක් මොණරාගල කාර්මික විද්‍යාලයේ දී පවත්වන ලදී. එය උක් පර්යේෂණ ආයතනය විසින් මෙම පාඨමාලාව හදාරන සිසුන් වෙනුවෙන් වාර්ෂිකව ක්‍රියාත්මක කරන වැඩසටහනකි. මොණරාගල කාර්මික විද්‍යාලය මේ වන විට NVQ 3 හා 4 මට්ටමේ අධ්‍යයන පාඨමාලා රැසක් පවත්වයි. මෙම පාඨමාලා හැදෑරීම සඳහා අ.පො.ස.(සා.පෙ) විභාගයට පෙනී සිටි ඕනෑම සිසුවෙකුට සම්බන්ධවිය හැකි අතර, තමන් කැමති විෂය පථයක් ඔස්සේ වෘත්තිය පුහුණුව සම්පූර්ණ කළ හැකිය.

# උක් වගාව සම්බන්ධ
# ව්‍යාප්ති හා පුහුණු වැඩසටහන්

## රුහුණු සරසවියේ කෘෂි පීඨයේ සිසුන් සඳහා ප්‍රායෝගික පුහුණුව



ප්‍රායෝගික පුහුණු වැඩසටහනට සහභාගී වූ සිසුන් කණ්ඩායම

රුහුණු විශ්වවිද්‍යාලයේ කෘෂිවිද්‍යා පීඨයේ සිසුන් කණ්ඩායමක් වෙනුවෙන් උක් වගාවේ ප්‍රායෝගික ක්‍රියාකාරකම් පිළිබඳ පුහුණු වැඩසටහනක් උක් පර්යේෂණ ආයතනයේ දී පවත්වන ලදී.

මෙම වැඩසටහන මගින් උක් වගාවේ මූලික බිම් සැකසීමේ සිට අස්වනු නෙළීම දක්වා සියලුම වගා පාලන කටයුතු මෙන්ම නිරි වගාවක් නඩත්තු කිරීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග පිළිබඳව ප්‍රායෝගික දැනුම ලබා දෙන ලදී.



සිසුන් ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල නිරත වෙමින්

## සිව්රෝද ට්‍රැක්ටර් රථ ක්‍රියාකරුවන්ගේ ඵලදායිතාව ඉහළ නැංවීමේ වැඩමුළුව



ක්ෂේත්‍රයේ සිට ප්‍රායෝගික පුහුණුව ලබා දෙමින්

සිව්රෝද ට්‍රැක්ටර් රථ නිවැරදි භාවිතය, නඩත්තුව, උපකරණ නිවැරදිව සවිකිරීම හා නිවැරදි බිම් සැකසීම පිළිබඳ ඒක්දින පුහුණු වැඩසටහනක් 2022 අගෝස්තු 04 දින ලංකා සීනි පුද්ගලික සමාගමේ සෙවනගල පරිශ්‍රයේ දී පවත්වන ලදී.

සෙවනගල ඒකකයේ ශෂ්‍ය විද්‍යා අංශයේ ඉල්ලීමකට අනුව උක් පර්යේෂණ ආයතනයේ තාක්ෂණ හුවමාරු හා සංවර්ධන අංශය මගින් මෙම වැඩමුළුව සංවිධානය කළ අතර, යාන්ත්‍රිකරණ තාක්ෂණ අංශයේ පර්යේෂණ නිලධාරී ආචාර්ය තිලංක ආරියවංශ විසින් වැඩමුළුව මෙහෙයවන ලදී.

මේ සඳහා සෙවනගල ඒකකයේ ට්‍රැක්ටර් රථ ක්‍රියාකරුවන් කණ්ඩායමක් සහභාගී වූ අතර, එහි ප්‍රධාන මෙහෙයුම් නිලධාරී, සාමාන්‍යාධිකාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී(කෘෂි),ශෂ්‍ය විද්‍යාඥ හා ඉඩම් සංවර්ධන අංශයේ අංශ ප්‍රධානී ඇතුළු නිලධාරී කණ්ඩායමක් ද සහභාගි විය.

## පාංශු විද්‍යාගාරය තුළ සිදුකරෙන විවිධ විශ්ලේෂණයන් පිළිබඳ එක්දින පුහුණු වැඩමුළුව

ලංකා සීනි සමාගමේ සෙවනගල ඒකකයේ ශෂ්‍ය විද්‍යා අංශයේ ඉල්ලීමකට අනුව එහි කෘෂි කළමනාකරුවන් හා කෘෂිකර්ම නිලධාරීන් වෙනුවෙන් පාංශු විශ්ලේෂණයන් සිදු කිරීම පිළිබඳව එක්දින පුහුණු වැඩමුළුවක් උක් පර්යේෂණ ආයතනයේ දී පවත්වන ලදී. මෙහිදී සාම්පල ලබා ගැනීම, සාම්පල් විශ්ලේෂණය කිරීම හා අවසානයේ පොහොර නිර්දේශයක් ලබා දීම දක්වා සිදුවන ක්‍රියාවලිය පිළිබඳව පුළුල් අවබෝධයක් ලබා දෙන ලදී. මෙම වැඩසටහන බෝග පෝෂණ අංශය මගින් මෙහෙයවනු ලැබූ අතර, තාක්ෂණ හුවමාරු හා සංවර්ධන අංශය විසින් සංවිධානය කරන ලදී.



බෝග පෝෂණ අංශයේ නිලධාරීන් විසින් වැඩසටහන මෙහෙයවමින්

## සිවිරෝද ට්‍රැක්ටර් රථ ක්‍රියාකරුවන්ගේ ඵලදායිතාව ඉහළ නැංවීමේ වැඩමුළුව



ක්ෂේත්‍රයේ සිට ප්‍රායෝගික පුහුණුව ලබා දෙමින්

කෘෂි යන්ත්‍රෝපකරණ නිවැරදි භාවිතය, නඩත්තුව, හා නිවැරදි ආකාරයට බිම් සැකසීම පිළිබඳ එක්දින පුහුණු වැඩමුළුවක් 2022 අගෝස්තු 31 උක් පර්යේෂණ ආයතනයේ දී පවත්වන ලදී. සෙවනගල ඒකකයේ ශෂ්‍ය විද්‍යා අංශයේ ඉල්ලීමකට අනුව උක් පර්යේෂණ ආයතනයේ තාක්ෂණ හුවමාරු හා සංවර්ධන අංශය මගින් මෙම වැඩසටහන සංවිධානය කළ අතර, යාන්ත්‍රීකරණ තාක්ෂණ අංශයේ පර්යේෂණ නිලධාරී ආචාර්ය තිලංක ආරියවංශ විසින් වැඩමුළුව මෙහෙයවන ලදී. මේ සඳහා සෙවනගල ඒකකයේ ට්‍රැක්ටර් රථ ක්‍රියාකරුවන් කණ්ඩායමක් සහභාගි විය.

## පොළොන්නරුවේ ව්‍යවසායකයින් පිරිසකට පවත්වන ලද උක් හකුරු හා පැණි නිෂ්පාදනය පිළිබඳ පුහුණුව

පොළොන්නරුව නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (අන්තර් පළාත්) කාර්යාලයේ ඉල්ලීමකට අනුව එම ප්‍රදේශයේ ව්‍යාවසායකයින් පිරිසකට උක් ආශ්‍රිත අතුරු නිෂ්පාදනය සම්බන්ධ එක්දින ප්‍රායෝගික පුහුණු වැඩසටහනක් 2022 අගෝස්තු 24 දින උක් පර්යේෂණ ආයතනයේ දී පවත්වන ලදී. මෙහිදී උක් හකුරු හා පැණි නිෂ්පාදනය මෙන්ම උක් වගාවේ බීජ සිටුවීමේ සිට අස්වනු නෙළීම දක්වා වූ ප්‍රායෝගික ක්‍රියාකාරකම් පිළිබඳවද දැනුම ලබා දෙන ලදී. නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය වෙනුවෙන් එහි විෂයභාර නිලධාරී හා ප්‍රදේශයේ ව්‍යවසායකයින් සිව් දෙනෙකු මේ සඳහා සහභාගී විය.



උක් හකුරු නිෂ්පාදනය පිළිබඳ ප්‍රායෝගික පුහුණුව ලබා දෙමින්

## පාසල් සිසුන් වෙනුවෙන් අධ්‍යාපනික වැඩසටහන්



උක් පර්යේෂණ ආයතනයේ ස්ථාපිත කාලගුණ විද්‍යා ඒකකය පිළිබඳ දනුවත් කරමින්



උක් පර්යේෂණ ආයතනයේ ඉදිකර ඇති උණුදිය ප්‍රතිකාර ඒකකය පිළිබඳ දනුවත් කරමින්

හල්දුම්මුල්ල ආනන්ද මධ්‍ය මහා විද්‍යාලයේ අ.පො.ස. උසස් පෙළ තාක්ෂණවේදය විෂය හදාරන සිසුන් කණ්ඩායමක් අගෝස්තු 30 දින උක් පර්යේෂණ ආයතනයේ ක්ෂේත්‍ර චාරිකාවකට එක් විය. එහිදී උක් පර්යේෂණ ආයතනයේ ස්ථාපිත කාලගුණ විද්‍යා ඒකකය හා උණුදිය ප්‍රතිකාර ඒකකය පිළිබඳ දැනුවත් කරන ලදී. මෙම දැනුවත් කිරීම් බෝග හා සම්පත් කළමනාකරණ අංශය හා තාක්ෂණ හුවමාරු හා සංවර්ධන අංශය එක්ව සිදු කරන ලදී.

# උක් වගාවේ නිෂ්පාදන පිරිවැය - 2022

## සෙවනගල - වර්ෂාපෝෂිත

| ක්‍රියාකාරකම | පැළ වගාව | නිරි වගාව | අවුරුදු 4ක සාමාන්‍ය |
|---|---|---|---|
| බිම් සැකසීම | 28,250.00 | - | - |
| සිටුවීම/ නිරි කිරීම | 108,000.00 | 30,850.00 | - |
| පොහොර යෙදීම | 136,400.00 | 156,100.00 | - |
| වල් මර්දනය | 71,364.00 | 62,364.00 | - |
| ජලය සැපයීම | - | - | - |
| අස්වනු නෙළීම හා පැටවීම | 202,400.00 | 190,900.00 | - |
| අනෙකුත් පාලන කටයුත | 32,000.00 | 24,000.00 | - |
| පොළිය (අමුද්‍රව්‍ය) | 29,702.00 | 20,816.00 | - |
| මුළු වියදම | 608,116.00 | 485,030.00 | 521,551.00 |
| දළ අස්වැන්න (හෙ./මෙ.ටොන්) | 88 | 83 | 80.5 |

## සෙවනගල - වාරිපෝෂිත

| ක්‍රියාකාරකම | පැළ වගාව | නිරි වගාව | අවුරුදු 4ක සාමාන්‍ය |
|---|---|---|---|
| බිම් සැකසීම | 28,173.00 | - | - |
| සිටුවීම/ නිරි කිරීම | 106,000.00 | 30,800.00 | - |
| පොහොර යෙදීම | 140,400.00 | 158,100.00 | - |
| වල් මර්දනය | 68,704.00 | 63,259.00 | - |
| ජලය සැපයීම | 40,500.00 | 30,500.00 | - |
| අස්වනු නෙළීම හා පැටවීම | 287,500.00 | 276,000.00 | - |
| අනෙකුත් පාලන කටයුත | 24,000.00 | 24,000.00 | - |
| පොළිය (අමුද්‍රව්‍ය) | 28,953.00 | 22,723.00 | - |
| මුළු වියදම | 726,230.00 | 605,382.00 | 625,129.00 |
| දළ අස්වැන්න (හෙ./මෙ.ටොන්) | 125 | 120 | 114.25 |

## පැල්වත්ත - වර්ෂාපෝෂිත

| ක්‍රියාකාරකම | පැළ වගාව | නිරි වගාව | අවුරුදු 4ක සාමාන්‍ය |
|---|---|---|---|
| බිම් සැකසීම | 68,795.00 | - | - |
| සිටුවීම/ නිරි කිරීම | 102,750.00 | 31,280.00 | - |
| පොහොර යෙදීම | 137,250.00 | 151,600.00 | - |
| වල් මර්දනය | 55,588.00 | 40,440.00 | - |
| ජලය සැපයීම | - | - | - |
| අස්වනු නෙළීම හා පැටවීම | 142,600.00 | 151,800.00 | - |
| අනෙකුත් පාලන කටයුත | 8,750.00 | 8,000.00 | - |
| පොළිය (අමුද්‍රව්‍ය) | 27,735.00 | 19,805.00 | - |
| මුළු වියදම | 543,468.00 | 402,925.00 | 379,202.00 |
| දළ අස්වැන්න (හෙ./මෙ.ටොන්) | 62 | 66 | 60.75 |

## ගල්ඔය - වාරිපෝෂිත

| ක්‍රියාකාරකම | පැළ වගාව | නිරි වගාව | අවුරුදු 4ක සාමාන්‍ය |
|---|---|---|---|
| බිම් සැකසීම | 39,150.00 | - | - |
| සිටුවීම/ නිරි කිරීම | 101,000.00 | 22,430.00 | - |
| පොහොර යෙදීම | 68,000.00 | 68,000.00 | - |
| වල් මර්දනය | 61,250.00 | 42,420.00 | - |
| ජලය සැපයීම | 20,500.00 | 20,500.00 | - |
| අස්වනු නෙළීම හා පැටවීම | 200,000.00 | 187,500.00 | - |
| අනෙකුත් පාලන කටයුතු | 20,000.00 | 20,000.00 | - |
| පොළිය (අමුද්‍රව්‍ය) | 15,432.00 | 5,668.00 | - |
| මුළු වියදම | 525,332.00 | 366,518.00 | 514,654.00 |
| දළ අස්වැන්න (හෙ./මෙ.ටොන්) | 80 | 75 | 73.75 |

## ඇතිමලේ - වර්ෂාපෝෂිත

| ක්‍රියාකාරකම | පැළ වගාව | නිරි වගාව | අවුරුදු 4ක සාමාන්‍ය |
|---|---|---|---|
| බිම් සැකසීම | 60,000.00 | - | - |
| සිටුවීම/ නිරි කිරීම | 102,000.00 | 35,440.00 | - |
| පොහොර යෙදීම | 114,200.00 | 120,200.00 | - |
| වල් මර්දනය | 79,500.00 | 75,500.00 | - |
| ජලය සැපයීම | - | - | - |
| අස්වනු නෙළීම හා පැටවීම | 138,000.00 | 147,200.00 | - |
| අනෙකුත් පාලන කටයුතු | 10,000.00 | 8,000.00 | - |
| පොළිය (අමුද්‍රව්‍ය) | 26,184.00 | 18,984.00 | - |
| මුළු වියදම | 529,884.00 | 405,324.00 | 420,364.00 |
| දළ අස්වැන්න (හෙ./මෙ.ටොන්) | 60 | 64 | 56 |

### සටහන

- වියදම් හෙක්ටයාර එකකට රුපියල් වලින් දක්වා ඇත.
- යොදන සියලුම පොහොර 50kg මිල රු.10,000.00ක් ලෙස සලකා ඇත.
- විවිධ සීනි කර්මාන්තශාලාවලින් ලබා දෙන වගා සහනාධාර ඇතුළත් කර නැත.
- උක් වගාවේ වියදම, ආදායම හා ලාභය, ලබාගන්නා අස්වැන්න හා උක් මිල මත තීරණය වේ.


**උපදේශකත්වය**
ආචාර්ය නිමල් කුමාරසිංහ - සභාපති
ආචාර්ය එම්. එස්. පෙරේරා - අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරි

**සංස්කාරක මණ්ඩලය**
ඩී. පී. ඩබ්ලිව්. පොත්තවෙල - තාක්‍ෂණ සම්ප්‍රේෂණ නිලධාරි
කේ. ඒ. ඩී. කොඩිතුවක්කු - ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි
එල්. එම්. ජේ. ආර්. විජයවර්ධන - පර්යේෂණ නිලධාරි
අමිල ප්‍රසාද් කරුණාතිලක - සංවර්ධන නිලධාරි
ඒ. එන්. එම්. බී. ආර්. ප්‍රභාත් - සංවර්ධන නිලධාරි

**පිටු සැකසුම හා නිර්මාණකරණය**
අමිල ප්‍රසාද් කරුණාතිලක - සංවර්ධන නිලධාරි

**ලිපි සහ තොරතුරු සැපයීමෙන් දායකත්වය**
ඩී. පී. ඩබ්ලිව් පොත්තවෙල - තාක්ෂණ සම්ප්‍රේෂණ නිලධාරි
කේ. ඒ. ඩී. කොඩිතුවක්කු - ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි
බී. ඩී. එස්. කේ. ආරියවංශ - ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි
ඒ. එම්. එම්. එස්. පෙරේරා - ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි
ආචාර්ය තිලංක ආරියවංශ - පර්යේෂණ නිලධාරි
ජී. ඒ. ඒ. චතුරංග - පර්යේෂණ නිලධාරි
එම්. පී. පී. නටාෂා සෙව්වන්දි - පර්යේෂණ නිලධාරි
ඩබ්ලිව්. පී. එම්. එස්. වේරගොඩ - සංවර්ධන නිලධාරි
අමිල ප්‍රසාද් කරුණාතිලක - සංවර්ධන නිලධාරි
ඒ. එන්. එම්. බී. ආර්. ප්‍රභාත් - සංවර්ධන නිලධාරි


උක් කර්මාන්තයට අදාළ ලිපි සැපයීමෙන් පුවත් හසුන ඉදිරි කලාපයන් සඳහා ඔබට දායක විය හැකි අතර, එම ලිපි ලේඛන, ඔබගේ අදහස් හා යෝජනා පහත ලිපිනයට යොමු කරන්න.


**සංස්කාරක**
පුවත් හසුන
උක් පර්යේෂණ ආයතනය
උඩවලව
ඊ මේල්: puwathhasunasri@gmail.com

**විමසීම්**
අධ්‍යක්ෂ, උක් පර්යේෂණ ආයතනය, උඩවලව
දුරකථන: 047 22 33281, 047 22 33285 ෆැක්ස්: 047.22 33233
ඊ මේල්: puwathhasunasri@gmail.com
වෙබ් අඩවිය: www.sugarres.lk


Follow us on


ප්‍රකාශනය - තාක්‍ෂණ හුවමාරු හා සංවර්ධන අංශය - උක් පර්යේෂණ ආයතනය